සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 11 - 2023**

# සිංහල භාෂාව හා සාහිත්‍යය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. ''මගේ **ඇඟට ලේ ඉනුවේ** දැන් යැයි'' අම්මා පැවසුවා ය.
(1) අසනීපය සුව වූයේ (2) අවදානම් අනතුරකින් ගැලවුණේ
(3) ශරීරයට ශක්තිය ලැබුණේ (4) පෝෂ්‍යදායි ආහාර ලැබුණේ

02. ඔහු ගේ **වවුල් වත නිසා** ඇගේ විවාහය දෙදරා ගියේ ය.
(1) ශරීරය වවුලෙකුගේ වැනි නිසා (2) මුහුණ අවලස්සන නිසා
(3) ස්ථිර ප්‍රතිපත්තියක් නැති නිසා (4) ගහ බැණ ගැනීම නිසා

03. සමන්සිරි **දියරෙද්දෙන් බෙල්ල කැපීමට** දක්ෂයෙකි.
(1) මිතුරු වෙසින් සිට සතුරුකම් කිරීමට (2) ආයුධ නැති ව කෙනෙක් මැරීමට
(3) කපටි වැඩ කිරීමට (4) අනුන් ගේ දෙය කඩා වඩා ගැනීමට

- අංක 04 - 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. මේ සුන්දර දිවයින වටා පිහිටි වෙරළ තීරය සිරිලක් මවගේ ගෙල බැඳි මුතුපටක් සේ ..............................
(1) ලස්සන ය. (2) සෞන්දර්යාත්මක ය.
(3) දර්ශනීය වේ. (4) චිත්තාකර්ෂණීය ය.

05. ශ්‍රී ලංකාව විදේශීය ....................................... මුදවා ගැනීම සඳහා අතීත ශ්‍රී ලාංකික ජනනායකයෝ දිවි පරදුවට තබා සටන් වැදුණ හ.
(1) ආධිපත්‍යයෙන් (2) ග්‍රහණයෙන් (3) බැල්මෙන් (4) හිමිකමෙන්

06. මෙලෙස සාහිත්‍යය ............................ වීම කෙරෙහි ප්‍රතිභාසම්පන්න නිර්මාණකරුවන් සිටීමත් එබඳු නිර්මාණ රසවිඳීමට හැකි සංවේදී මනසකින් යුතු රසික පිරිසක් සිටීමත් හේතු වී ඇත.
(1) දියුණු (2) පෝෂණය (3) ඵලදායි (4) නිර්මාණශීලි

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සමස්ථ, නැමෙනසුලු, කුණ්ඩලාභරණ, දෘශ්‍යාධාර
(2) දේවාබරණ, ධර්මදේශනය, පරිණාමය, මධ්‍යස්ත
(3) යථාවබෝධය, රැකීරක්සා, ලවණ, වෙරළ
(4) උච්චාරණය, ශිෂ්ටාචාරය, නිෂ්පාදනය, දේශනය

08. පාපිස්ස, තරුව, චක්‍රය, විකෘති යන වචනවල දෙවන අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය, රකාරාංශය, ගැටය සහිත ඇලපිල්ල
(2) රකාරාංශය, කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ගැටය සහිත ඇලපිල්ල
(3) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, රකාරාංශය, ගැටය සහිත ඇලපිල්ල
(4) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, රකාරාංශය, ගැටය සහිත ඇලපිල්ල

09. ''බකමූණා'' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) ඕෂ්ඨජ, කණ්ඨජ, මූර්ධජ (2) ඕෂ්ඨජ, කණ්ඨජ, දන්තජ
(3) කණ්ඨජ, ඕෂ්ඨජ, තාලුජ (4) මූර්ධජ, ඕෂ්ඨජ, දන්තජ

10. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) මාතර, කටුගස්තොට, යාපනය, දෙහිවල
(2) කුරුණෑගල, මඩකලපුව, රත්නපුරය, වට්ටාරම
(3) හම්බන්තොට, බම්බලපිටිය, තලවකැලේ, ගම්පොළ
(4) මහනුවර, මීරිගම, පේරාදෙණිය, පස්යාල

11. අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ළමයා, මුවෙක්, ගොවියන්, කුරුල්ලන් (2) කුරුල්ලන්, මුගටියන්, වඳුරෙක්, කම්කරුවන්
(3) කාන්තාවක, බුද්ධිමතෙකු, ශිල්පියෙකු, ගවයන් (4) ගුරුවරු, ශිෂ්‍යයන්, ලේඛකයෙක්, නිළියක්

12. ''ගුරුවරු දරුවනට සිප්සතර නොමසුරු ව දෙති'' යන වාක්‍යයෙහි දරුවනට යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) ප්‍රථමා (2) කර්ම (3) සම්ප්‍රදාන (4) ආලපන

13. ''සුන්තුරු'' යන්න අයත් වනුයේ,
(1) විශේෂණ සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය. (4) 'ද' කාරාර්ථ සමාසයට ය.

14. 'බලති' යන පදයේ ධාතු ප්‍රකෘතිය වන්නේ,
(1) බැලූ (2) බලන්නේ (3) බලන (4) බල

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) සන්ධි - දකුණත, මුවපියුම, ගුරුතුමා, නිලුපුල්
(2) මිශ්‍ර ක්‍රියා - බලමින්, කඩ කඩා, නටමින්, අඬ අඬා
(3) තද්ධිත - රූමත්, පියාණෝ, ස්වදේශීය, උදාරතර
(4) උපසර්ග - සුපිරිසිදු, ප්‍රබල, දුදන, ඉම්හිරි

16. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී නැති වාක්‍ය කුමක් ද?
(1) සඳ පායද්දී කුමුදුණියෝ විකසිත වෙති.
(2) ගුරුතුමිය පන්තියට පැමිණෙන විට ළමයි නිශ්ශබ්ද වූහ.
(3) තාත්තා එනකොට රසකැවිලි ගෙනෙයි.
(4) ඔබ ගියොත් මම ද එමි.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17. අතීතයේ **ප්‍රාචීන භාෂා** රාශියක් උගත් අය සිටිය හ.
(1) පෙර අපර භාෂා (2) පෙරදිග භාෂා (3) අපරදිග භාෂා (4) සංස්කෘත භාෂා

18. අතීතයේ ස්වයංපෝෂිත ලංකාවකට හිමිකම් කීමට නරපතීන් ගේ **බුජබලය** හේතුවක් වන්නට ඇත.
(1) මිනිස් බලය (2) තාක්ෂණික බලය (3) බාහු බලය (4) ශරීර ශක්තිය

19. ඔහු **ආනන කල** ගඳක් නිකුත් වුණි.
(1) ඇනුම් අරින විට (2) කථා කරන විට (3) බිම හාරන විට (4) කසළ අවුස්සන විට

20. සමානාර්ථ නොදෙන පද යුගලයක් සහිත වරණය තෝරන්න.
(1) තුරු - තරු, අඹ - ජලය, පුන් - පිරුණු, සෙද - වහා
(2) සුළඟ - නල, දිගැස - කාන්තාව, වානර - වඳුරු, උපුල් - මහනෙල්
(3) පක්ෂි - සියොත්, රජ - භූපති, ප්‍රහර්ෂය - ප්‍රීතිය, විශේෂ - වෙසෙස්
(4) ප්‍රවීණ - ආධුනික, දෘෂ්ටිය - දැක්ම, වත - මුහුණ, ව්‍යසනය - විපත

21. මුළින් දී ඇති පදයට සමානාර්ථ නො යෙදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) ප්‍රචලිත - පතළ, පැතිරුණු, ප්‍රසිද්ධ, පුවතර (2) මාර්ගය - වීදිය, පථය, මාවත, මං
(3) සතුරු - පිළිමල්, රිපු, අමිතුරු, රුපු (4) ස්ථිර - නිති, නියත, තිර, නම්‍ය

22. විරුද්ධාර්ථ නොදෙන පද යුගලය සහිත වරණය තෝරන්න.
(1) භාෂණ - කථන (2) අපේක්ෂිත - අනපේක්ෂිත
(3) පාපිෂ්ඨ - ධර්මිෂ්ඨ (4) බුහුමන් - අවමන්

23. වැරදි අදහස දෙන වරණය තෝරන්න.
    (1) ඓ, ඖ සංයුක්ත ස්වර අක්ෂර ය.
    (2) ''පියාණනි'' යන්න ආලපන විභක්තියට අයත් ය.
    (3) ''රජතුමා'' යන්නෙහි අනුක්ත පදය ද ''රජතුමා'' යන්න ය.
    (4) ල / ලු අවධාරණාර්ථයේ නිපාත ය.

24. අර්ධ ස්වර අක්ෂරයක් නොයෙදුණු පදයක් සහිත වරණය කුමක් ද?
    (1) සසර, පවන, දිනන, ලණුව (2) වසන, දිනය, නයන, දෙරණ
    (3) නිලය, බලන, ධනය, කරන (4) වසර, වේලාව, ග්‍රන්ථය, නිවස

25. පහත අක්ෂර ගැළපීමෙන් නිවැරදි නාමයක් සැකසෙන පිළිතුර තෝරන්න.
    (1) ලසූයදන්පරි (2) ලිඩකුමග (3) කුරනුගමාං (4) රදූවසච්

- **අංක 26 හා 27 ප්‍රශ්නවල මුලින් දී ඇති අදහස්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ සහිත වරණය කුමක් ද?**

26. අයහපත් සුළු බලපෑමෙන් යහපත් සියල්ල අයහපත් වේ.
    (1) ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ (2) කිරි කළයට ගොම බිඳක් දැම්මා වගේ
    (3) කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ (4) ඉත්තෑවගේ ගෙට කබල්ලෑව රිංගුවා වගේ

27. තමන් නොකරන කාර්යය අනුන්ට ද කිරීමට නොදීම
    (1) බළලුන් ලවා කොස් ඇට බාවනවා වගේ
    (2) එළ හරකයි මී හරකයි ඈඳුවා වගේ
    (3) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
    (4) අඬන්න ඉන්න මිනිහට ඇඟිල්ලෙන් ඇන්න වගේ

28. පූර්වස්වරලෝප සන්ධියට හා ආගම සන්ධියට උදාහරණ පිළිවෙළින් දී ඇති වරණය තෝරන්න.
    (1) ගිරග, කම්මල (2) සුරත, මුනිතුමා (3) සුරත, කටුවල (4) මුලසුන, කටුවල

- අංක 29 හා 30 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

29. (1) ඔහු වීරයෙකු මෙන් පෙරට ගියේ ය.
    (2) අපි ගුරුවරු සමඟ ප්‍රදර්ශනය නැරඹුවෙමු.
    (3) ගොවියෝ කුඹුර වපුරද්දී වැසි ලකුණු පහළ විය.
    (4) දරුවන්ගේ දක්ෂතා ඇගයෙති.

30. (1) ඕ තොමෝ විසිතුරු ඇඳුමින් සැරසෙති.
    (2) තරුණයෝ නිතර ම අයහපතට යොමුවන්නන් ද?
    (3) අක්කා ද මම ද වහා එතැනට ගියෙමි.
    (4) සරච්චන්ද්‍ර මහතා දක්ෂ නාට්‍ය ශිල්පියෙක් ය.

31. * අවසන් තීරණය ලැබෙන .................... ක්‍රීඩකයෝ විමසිල්ලෙන් බලා සිටිති.
    * ජලය සිඳීයාම ...................................... කුඹුරු යායක් අනතුරේ පවතී.
    * අම්මා දරුවන් .................................... නගරයට යයි.
    * සාධාරණය ඉටුකරන ................................... ඔවුහු අධිකරණයෙන් ඉල්ලති.

    ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
    (1) තුරු, කැටුව, නිසා, ලෙස (2) තුරු, නිසා, කැටුව, ලෙස
    (3) කැටුව, නිසා, තුරු, ලෙස (4) ලෙස, නිසා, කැටුව, තුරු

32. පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?
    ''තකහනියෙ මේ වගෙ වැඩක් කෙරුවෙ ඇයි ?''
    (1) හදිසියේ මෙවැනි කාර්යයක් කළේ කුමකට ද?
    (2) අවධානම් ලෙස මෙසේ වැඩ කළේ ඇයි ?
    (3) උදෑසනම මේ වැනි කටයුත්තක් කළේ කුමකට ද?
    (4) අමනාපයෙන් මේ වගේ කාර්යයක් කළේ කුමට ද?

33. ''ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරු නටත් නටත්. මැදිරියෙහි හුන් ගිරා සැළලිහිණි ආදි පක්ෂීන් පියා පැහැර හඬත් හඬත්''
මෙම පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
(1) පූජාවලිය (2) බුත්සරණ (3) සද්ධර්මාලංකාරය (4) අමාවතුර

34. රූපකයක් සහිත වරණය තෝරන්න.
(1) නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹගෙඩි (2) දිසි රනලියෙව් රූ සිරි යුත් මෙපුරඟන
(3) උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ (4) විදෙන ලෙළෙන නරුබර පුළුලුකුළ රැඳී

35. ''මේ අසේව වැදහොත් වඳුරා මරා මස් කොට අනුභව කිරීමෙන් ශරීරයත් පුෂ්ටි කොට ගෙන මෙයින් මාර්ගෝපකරණයකුත් සපයා ගනිමි.''
මෙහි ''අසේව'' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) තද නින්දේ (2) කුසගින්නේ (3) කනගාටුවෙන් (4) වෙහෙස වී

36. පහත ගීත කොටසේ හිස්තැනට යෝග්‍ය පේළිය තෝරන්න.
සින්දූපමාන වැව්තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා හමා
සිත් ප්‍රබෝධයෙන් පුරා
..........................................................................
(1) එන්නෙ උන් හෙළු ප්‍රාණ වායුවයි (2) වීරයින්ගෙ ඒ යශෝ ගීතයයි
(3) සාර වූ උදාර වූ මාතෘ භූමියයි (4) ජීවිතේ පුදා හෙළු ලේ කඳයි

37. ''සිලිලාරෙක හෙල්මැලී
පෙති අතරින් සැලි සැලී
කනට නොයෙන සිතට දැනෙන
සිලි සිලියක පැටලිලා''
ඉහත නිර්මාණයේ රචකයා වන්නේ,
(1) මහගම සේකර (2) සිරි ගුණසිංහ
(3) එච්. එම්. කුඩලිගම (4) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

38. පතල් භාෂාවේ කැට ගල් සහිත පස් තට්ටුව හඳුන්වන නම කුමක් ද?
(1) සන්නම් (2) නාම්බුව (3) ඉල්ලම (4) දබරය

39. මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතාගේ නිර්මාණයක් වන්නේ,
(1) සක්වාලිහිණි (2) සෙංකොට්ටං (3) ප්‍රබුද්ධ (4) බෝඩිම

40. පහත සඳහන් පාඨයේ වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
සංවාද මෙන් ම වර්ණනා හා ආඛ්‍යානවල දී ද පැරණි සාහිත්‍යකරුවන්ගෙන් වෙනස් මාර්ගයක් දාහතරවන සියවසේ නව ප්‍රබන්ධකරුවන් විසින් අනුගමනය කරන ලදී.
(1) සියලු ප්‍රබන්ධකරුවන් නව ප්‍රබන්ධවල දී අනුගමනය කළේ පැරණි සාහිත්‍යකරුවන්ට වෙනස් වර්ණනා හා ආඛ්‍යානයන් ය.
(2) දාහතරවන සියවසේ නව ප්‍රබන්ධකරුවන් පැරණි සාහිත්‍යකරුවන්ට වෙනස් මඟක් සංවාද වර්ණනා, ආඛ්‍යානවල දී අනුගමනය කර ඇත.
(3) දාහතරවන සියවස දක්වා ප්‍රබන්ධකරුවන් සංවාද, වර්ණනා, ආඛ්‍යානවල දී පැරණි සාහිත්‍යකරුවන්ට වෙනස් මඟක් අනුගමනය කර ඇත.
(4) පැරණි සාහිත්‍යකරුවාගේ මඟ යමින් දාහතරවන සියවසේ ප්‍රබන්ධකරුවන් සංවාද, වරණනා, ආඛ්‍යාන ඉදිරිපත් කර ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

# සිංහල භාෂාව හා සාහිත්‍යය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

- අංක **(i)** සිට **(x)** දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) (අ) නාසික්‍ය අක්ෂර දෙකක් ලියන්න.

(ආ) ඌෂ්මාක්ෂර දෙකක් ලියන්න.

(i) පහත සඳහන් වාක්‍යවල ඇති ඉරි ඇඳි පදයේ ක්‍රියා වර්ගය ලියන්න.

(අ) ගුරුතුමිය සිසුන් ලවා රචනයක් <u>ලියවයි</u>.

(ආ) ගෙහිමියා බල්ලන් <u>බැඳ දමා</u> පිට විය.

(iii) පහත සඳහන් වාක්‍යවල ඇති ඉරි ඇඳි පදවල විභක්තිය ලියන්න.

(අ) <u>ගුරුවරු</u> දරුවන් අගයති.

(ආ) අක්කා <u>ගඟෙන්</u> මල් කඩා බුදුන් වැන්දා ය.

(iv) පහත වාක්‍යවල ඉරි ඇඳි පදයේ සමාස ප්‍රභේදය ලියන්න.

(අ) උපාසිකාව <u>තෙල් මල් පහන්</u> රැගෙන බුදුන් වැන්දා ය.

(ආ) පියවරු <u>සුසිරිත්</u> රැකිය යුත්තා හ.

(v) පහත සඳහන් වාක්‍ය වැරදි ය. නිවැරදි කර ලියන්න.

(අ) අපි ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් වෙමු.

(ආ) වෛද්‍යවරු රෝහලේ නැත්තේ ඇයි ?

(vi) (අ) අලු

(ආ) අළු යන වචන දෙකේ අර්ථය ප්‍රකාශ වනසේ නිවැරදි වාක්‍ය දෙකක් ලියන්න.

(vii) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(අ) ශිෂ්‍ය නායිකාවක් උදය රැස්වීම මෙහෙයවයි.

(ආ) කම්කරුවෝ පාලම ඉදි කළහ.

(viii) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාසයෙහි සදොස් පද දෙක පමණක් නිදොස් කර ලියන්න.

''විද්‍යාලීය නිවාසාන්තර ක්‍රීඩා උලෙළ අති උත්කර්ශවත් අන්දමින් පසු ගිය දා පැවැත්විණි.''

(ix) පහත සඳහන් වචන සඳහා යෙදෙන පොදු ව්‍යවහාර ලියන්න.

(අ) වල් ඇල්ලීම -

(ආ) කළුකපාළිය -

(x) පහත සඳහන් වැකිවලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) කිසිවෙකුට දෙවැනි නොවන

(ආ) පාද බොහෝ ගණනක් ඇති

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තරය අතුරෙන් එකක් තෝරාගෙන වචන 300 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනා ලිවීම ආරම්භ කරන්න. මාතෘකාවක් ද යොදන්න.

(අ) සමශීතෝෂ්ණ දේශගුණයක් ඇති සදාහරිත සොබාදහම් අසිරියෙන් අනූන රටකි ශ්‍රී ලංකාව. සොබාදහමෙන් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සියලු ම සාධක පිරුණු අප රට නවීන තාක්ෂණික දැනුම යොදා සංවර්ධනය කළ යුත්තේ කෘෂිකර්මාන්තයෙනි. එහෙත් නොවන්නේ ද එයයි. නව තාක්ෂණයෙන් සන්නද්ධ තරුණ ප්‍රජාවගේ වගකීම කෘෂිකර්මාන්තය නඟාසිටුවීමයි.

(ආ) විද්‍යුත් තිරවලට ඇබ්බැහි වීම නිසා වර්තමානයේ පාසල් සිසුන් පමණක් නොව වැඩිහිටි පරම්පරාව ද තම වැඩ කල් තබයි. කිසිදු ප්‍රයෝජනයකට නැති හුදු විනෝදාස්වාදය සඳහා ම විද්‍යුත් තිර වැඩිහිටියන් අතර ද බහුලව භාවිත වෙනු දැකිය හැක. තිරසාර කටයුතු සඳහා ම සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම වැදගත් ය.

(ඉ) තමා උපන් රටේ නිදහස් අධ්‍යාපනයේ ඵල නෙළා හොඳින් ඉගෙන විදේශ රටවලට තම සේවය ලබා දීමට බලා සිටින තරුණ පරපුර වර්තමානය වන විට බොහෝ ය. ශ්‍රී ලංකාව ලෝකයේ ම බුද්ධිමතුන්ට ප්‍රසිද්ධ රටකි. බුද්ධි ගලනයට ඉඩ නොදී තම රටට ම සේවය කිරීම දේශීය දූ පුතුන්ගේ වගකීමකි.

(ඊ) ස්වාභාවික පරිසරය වෙනස් කිරීම නිසා අද අප රටේ ස්වාභාවික විපත් ප්‍රමාණය වැඩි වී ඇත. සුළු වැස්සක දී පවා විශාල ගංවතුර තත්ත්ව ඇති වීම මෙයට හොඳ ම උදාහරණයකි. වැසි ජලය ගලා යාමට හෝ පොළවට උරා ගැනීමට නොහැකි වන සේ සිමෙන්ති ඉදිකිරීම් මෙයට ප්‍රධාන හේතුවයි. මෙවැනි ගොඩනැගිලි හා පොළව ආවරණය කිරීමේ දී මේ ගැන සැළකිලිමත් වීම වැදගත් ය.

(03) පහත දැක්වෙන ඡේදයේ වචන ගණන 50 - 55 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

මහා සම්ප්‍රදාය බොහෝ විට ලිඛිත සම්ප්‍රදායක් වන අතර එය මුළු සමාජයට ම පොදු විශ්වීය එකකි. එමෙන් ම එය ගැඹුරු වූ ද දාර්ශනික මට්ටමක පවත්නා වූ ද සම්ප්‍රදායකි. එහෙත් චූල සම්ප්‍රදාය මුඛ පරම්පරාගත සම්ප්‍රදායක් වශයෙන් සැලකේ. එහිදී ගැමියන්ගේ සිතුම්පැතුම් කට වචනයෙන් පැවත එන අතර එය ප්‍රාදේශීය එකක් ලෙස ද සරල සම්ප්‍රදායක් ලෙස ද පෙන්වා දිය හැකිය. ඒ අනුව ගැමි සංස්කෘතිය තේරුම් ගැනීමට චූල සම්ප්‍රදාය බොහෝ දුරට උපකාරී වේ. එහෙත් ඇතැම් සංස්කෘතිකාංග තේරුම් ගැනීමට මහා සම්ප්‍රදායත් චූල සම්ප්‍රදායත් යන අංග දෙක ම අවශ්‍ය බව දැක්විය හැකිය. ඒ අනුව ජන කවිය ද රෙඩ් ෆීල්ඩ්ගේ විග්‍රහයට අනුව චූල සම්ප්‍රදායට අයත් මාධ්‍යයක් බව පෙනේ.

ගැමි සංස්කෘතියේ පවතින විවිධාකාර වූ අත්දැකීම් මුඛ පරම්පරාගතවත් ඉතා සරල ආකාරයටත් ජන කවියෙන් ඉදිරිපත් කර ඇත. එම නිසා පැරණි ගැමි සමාජය යථාර්ථවාදී ව ග්‍රහණය කර ගැනීමට ජනකවියෙන් නොමඳ පිටුබලයක් ලැබේ. එබැවින් ජනකවිය පැරණි ගැමි සමාජයේ පිළිබිඹුවක් ලෙස හඳුන්වා දීමට පුළුවන. පැරණි සමාජය බොහෝවිට කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් යටතේ කේන්ද්‍රගත වී තිබුණි. ගැමියෝ දවස තිස්සේ ම තමන්ගේ ජීවනෝපාය පවත්වාගෙන යාමට කුඹුරු, හේන් ගොවිතැන් ආදියෙහි නියැලුණහ. මෙම කාර්යයේ දී ඔවුන්ගේ අත්දැකීම් ජනකවි මගින් එළි දක්වා ඇත.

(ලකුණු 10)

(04) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දහනම වන ශත වර්ෂය සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි සංක්‍රමණ යුගයක් ලෙස හැඳින්විය හැකිය. එම යුගය තරම් මෙරට සාහිත්‍යයෙහි ලොකු විපර්යාසයක් සිදු වූ අන්‍ය අවධියක් ඊට පෙර නොවූ තරම් ය. එතැන් සිට සිංහල සාහිත්‍යයෙහි ස්වරූපය වෙනස් වීම ඇරඹුණි. එකල ආරම්භ වූ විවිධ සාහිත්‍ය ව්‍යාපාරයන් පසුකාලය කෙරෙහි බෙහෙවින් බලපෑ බව පෙනේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් විසි වන ශත වර්ෂයේ දී අභිනව සාහිත්‍යයක් බිහි වීමට මග සැලසුණි. නවකතාව, කෙටිකතාව හා නාට්‍යය වත්මන් සමයෙහි අලුතින් බිහි වූ ප්‍රධාන කලා මාධ්‍යයන් ලෙස සැලකිය හැකිය. දහනම වන සියවසෙහි සිංහල සාහිත්‍යය ගැන අධ්‍යයනය කරන්නන් හට දුෂ්කරතා රාශියකට මුහුණ පෑමට සිදු වේ. එකල පළ වූ පොත් පත්වලින් සැහෙන සංඛ්‍යාවක් විනාශ මුඛයට පත් ව ඇත. මෙරට හෝ පිටරට හෝ පුස්තකාලවලින් සොයාගත හැක්කේ එකල පළ වූ කෘතීන්ගෙන් සුළු ප්‍රමාණයකි. නමුත් මෙසේ ආරක්ෂා වූ ග්‍රන්ථ වුව ද අධ්‍යයන කටයුතු සඳහා ලබා ගැනීම අසීරු කාර්යයකි.

දහනම වන සියවසෙහි බිහි වූ අභිනව ගද්‍ය සාහිත්‍යය පළමු වරට විමර්ශනයට භාජනය වූයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් අතිනි. එහි ස්වරූපය හා අන්තර්ගතය අතින් පැරණි සාහිත්‍යයට වඩා අමුතු මුහුණුවරක් ගත්තකි. එය අපරදිග භාෂාවන්ගෙන් පරිවර්තනය කෙරුණු කෘතීන්ගෙන් ද නව නිර්මාණයන්ගෙන් ද සමන්විත ය. එම කෘතීන් අතර අද්භූත සාහිත්‍යයට අයත් කතා පුවත් ද ක්‍රිස්තියානි සාහිත්‍යයට අයත් කතා පුවත් ද බහුල ය.

(i) සිංහල සාහිත්‍ය ඉතිහාසයේ විපර්යාසයන් සිදු වූ අවධිය හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

(ii) වර්තමානයට අලුතින් බිහි වූ ප්‍රධාන කලා මාධ්‍යයන් මොනවා ද?

(iii) 19 වන සියවසේ සිංහල සාහිත්‍ය අධ්‍යයනයේ දී ඇති වන දුෂ්කරතා දෙකක් සඳහන් කරන්න.

(iv) එකල ගද්‍ය සාහිත්‍ය පළමුවරට විමර්ශනය කළේ කවුරුන් ද?

(v) 19 වන සියවසේ බිහි වූ කෘතිවල අන්තර්ගත කරන පුවත් අයත් වන සාහිත්‍ය මොනවා ද?

(ලකුණු 2 x 5 = 10)

(05) (අ) අර්ධ නාගරික ප්‍රදේශයක පිහිටා ඇති ඔබ පාසලේ පරිසර සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න. වාරියපොළ ජයඉසුරු ගමේ සුන්දර පරිසරයක පිහිටි ඔබ පාසල අසලට මිනිසුන් විසින් කැලි කසළ ගෙනවිත් දමා විශාල ප්‍රදේශයක් අපවිත්‍ර කර ඇත. එයින් පාසලටත් ඔබටත් වන හානිය දක්වා එය වහා ම ඉවත් කර නැවත කසළ ගෙවිත් නොදැමීමට ක්‍රියාත්මක වන මෙන් ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලියන රාජකාරි ලිපිය ලියන්න.

**නැතහොත්**

(ආ) ඔබ පාසලේ චාරිකා සංගමය විසින් යන ක්ෂේත්‍ර චාරිකාවක් පිළිබඳ ව 11 වසරේ සිසුන් දැනුවත් කිරීම සඳහා ආකර්ෂණීය අත්පත්‍රිකාවක් සකස් කරන්න. (චිත්‍ර / පාට පෑන් භාවිත කළ හැක.)

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''තෝ තමාගේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය යැයි සිතයි ද?''
(අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?
(ආ) කා සඳහා ද?

(ii) (අ) පන්සියපනස් ජාතක පොත ලිවීමට අනුග්‍රහය දැක්වූයේ කවුරුන් ද?
(ආ) පන්සියපනස් ජාතක පොතේ දීර්ඝතම ජාතකකතාව කුමක් ද?

(iii) නොගොසින් සිට සිටි වන නිබඳේයා
වෙසෙසින් සුර නර සෙන් නොමඳේයා
.............................................................................................
.............................................................................................
ඉහත පද්‍යයෙහි ඉතිරි කවි පද දෙක සම්පූර්ණ කරන්න.

(iv) ''අවුරුදු දෙකක් තිස්සේ උත්සාහ කොටත් ගෙයි මැටි බිත්තිවල සවිය මැඩලන්නට සමත් නොවීය.''
(අ) ඉහත කොටස ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම මුල් කෘතියේ සිංහල අනුවර්තන කෘතිය කුමක් ද?

(v) ''මෙවෙනි සිංහනාදයෙක් අනෙකක් හට වන්නේ නොවෙයි''
(අ) මෙසේ සිතුයේ කවරෙක් ද?
(ආ) මෙය ඇතුළත් කෘතිය කුමක් ද?

(vi) (අ) රසවාහිනියෙහි කෑරගල ප්‍රදේශය හැඳින්වූයේ කුමන නමකින් ද?
(ආ) කෑරගල නම් ප්‍රදේශයේ පිහිටි විහාරය කුමක් ද?

(vii) කඳවුරු කුල මැඳුරු මිණි පහනෙව් සුසැදී
නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැදී
රජගුරු විජයබා පිරුවන් හිමි පැහැදී
.............................................................................................
(අ) ඉහත හිස්තැනට අදාළ පද්‍ය පාඨය සම්පූර්ණ කරන්න.
(ආ) සැළලිහිණි සන්දේශයේ අන්තර්ගත පද්‍ය ගණන කීයද?

(viii) (අ) සද්ධර්මරත්නාවලිය ලිවීමට පාදක කරගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියෙහි රචකයා නම් කරන්න.

(ix) ''නොලදොත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම් ද?''
(අ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කවුරුන් පිළිබඳව ද?
(ආ) මෙයට සවන් දෙනු ලබන්නේ කවුරුන් ද?

(x) (අ) ''ගංගාවේ සංගීතය'' පද්‍ය නිර්මාණය උපුටාගත් පද්‍ය ග්‍රන්ථය කුමක් ද?
(ආ) ''ගංගාවේ සංගීතය'' පද්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.

(02) පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''අපගේ රජ්ජුරුවන් කුමාර කල මෙසේ වූ දොළෙක් විය.''
(අ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කවුරුන් ද? එම ප්‍රකාශය කරනු ලබන්නේ කා හට ද?
(ආ) ඉහත කොටසින් ප්‍රකාශ වන්නේ කුමන දොළක් (ආශාවක්) පිළිබඳව ද?

(ii) වනසිරි **පියුම්රා** බඳ රන' බරණ යුරු
වටපිරි සුපුල් දුනුකේ මල් මුරුත'තුරු
බිඟුපිරි වැරූ ඔලු'පුලැ' ඕලවල **තඹුරු**
හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) ඉහත පද්‍යයේ සඳහන් ජලාශයේ ස්වභාවය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් ලියන්න.

(iii) ''මවුපියන්ගේ ගොත් විසින් බැහැවර කරනු මැනැවැ'යි සිතා වහන්සේ, තොප පියෙ කවර? මවු කවර ? යි පිළිවිත''
(අ) ඉහත සඳහන් විමසීම කරනු ලබන්නේ කවුරුන් ද? එය ශ්‍රවණය කරනු ලබන්නේ කවුරුන් ද?
(ආ) ඉහත සඳහන් ප්‍රකාශයෙහි සඳහන් පියාගේ හා මවගේ නම කුමක් ද?

(iv) රාජකුමරියෝ පලඳිති
රන් මිණි බරණා
සිනිඳු වස්ත්‍ර හැඳලා රන්
මිරිවැඩි සඟළා
පින් පිඬ වැනි මා මැණිය
කියනු **නොවළහා**
ඇයි ද **වල්කලා** පොරවා
ලෙන තුළ ඉන්නේ

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) ඉහත ප්‍රකාශයෙහි සඳහන් උපමාලංකාර කොටස උපුටා දක්වන්න.

(v) රැති වනපෙතිනැවිදින් **සුමුවෝයා**
නිති මියුරැති වෙණ නදළමුවෝයා
සිතුවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් **සමුවෝයා**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) වීණා වාදනයේ මිහිරියාව නිසා සිදු වූ අපූර්ව සිදුවීම කෙටියෙන් ලියන්න.

(03) (i) අර්ථ රසයත්
(ii) ශබ්ද රසයත්
මැනවින් සංකලනය කරමින් රසවත් කාව්‍ය නිර්මාණයක් ඉදිරිපත් කිරීමට ගුත්තිල කතුවරයා දැක් වූ ප්‍රතිභාව නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

අගුල්මල් දමන කතාවේ අහිංසකගේ චරිතය නිරූපණය කර ඇත්තේ,
(i) සුවච කීකරු ගති ලක්ෂණ හෙබි චරිතයක් ලෙසත්
(ii) බාහිර හේතු නිසා දාමරික ගති ලක්ෂණ සහිත චරිතයක් ලෙසත් ය. එක් කරුණකට උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න.

(04) කුරක්කන් කවි මගින් ගොවියා,
(i) දැඩි වෙහෙසක් දරමින් අභියෝග ජයගත් බවත්,
(ii) දැරූ වෙහෙස අව්‍යාජව ඉදිරිපත් කර ඇති බවත් මනාව නිරූපණය වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙකක් දක්වමින් විමසන්න.

**නැතහොත්**

ජාතක කතාකරුවා උම්මග්ග ජාතක කතාව තුළ,
(i) මහෞෂධ චරිතය උසස් ප්‍රබල චරිතයක් ලෙසත්,
(ii) කේවට්ට චරිතය හාස්‍ය උපහාසය දැනවෙන චරිතයක් ලෙසත්, නිරූපණය කොට ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(05) සිංහබාහු නාට්‍යයේ සිංහබාහුගේ චරිතයෙන් නිරූපණය කර ඇත්තේ නව යොවුන් වියේ තරුණයකුගේ ස්වභාවයයි. නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(06) සැළලිහිණි සන්දේශ කතුවරයා කාව්‍ය උපක්‍රම යොදාගනිමින් ස්වභාව සෞන්දර්ය වර්ණනය කර ඇති අයුරු නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(07) ලෝකයාගෙන් ගැරහුම් ලැබුණත් ඉවසීමෙන් රටට, ජාතියට, ආගමට යුතුකම් ඉටුකරන ලෙස එස්. මහින්ද හිමි දැයේ දරුවන්ට පාඩමක් උගන්වයි. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (3) | 21 - (4) | 31 - (2) |
| 2 - (3) | 12 - (3) | 22 - (1) | 32 - (1) |
| 3 - (1) | 13 - (2) | 23 - (4) | 33 - (2) |
| 4 - (4) | 14 - (4) | 24 - (1) | 34 - (3) |
| 5 - (1) | 15 - (1) | 25 - (2) | 35 - (4) |
| 6 - (2) | 16 - (4) | 26 - (2) | 36 - (1) |
| 7 - (4) | 17 - (2) | 27 - (3) | 37 - (4) |
| 8 - (4) | 18 - (3) | 28 - (3) | 38 - (3) |
| 9 - (1) | 19 - (1) | 29 - (1) | 39 - (2) |
| 10 - (2) | 20 - (4) | 30 - (4) | 40 - (2) |

## II කොටස (නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

01 (i) (අ) ඞ, ඤ, ණ, න, ම
(ආ) ශ, ෂ, ස, හ, ෆ, අඃ

(ii) (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා
(ආ) පූර්ව ක්‍රියා

(iii) (අ) ප්‍රථමා විභක්ති
(ආ) අවධි විභක්ති

(iv) (අ) 'ද' කාරාර්ථ සමාස
(ආ) අව්‍ය සමාසය

(v) (අ) අපි ශ්‍රී ලාංකික ශිෂ්‍යයෝ වෙමු.
(ආ) වෛද්‍යවරුන් රෝහලේ නැත්තේ ඇයි ?

(vi) (අ) අලු - ආලෝකය
(ආ) අළු - භෂ්ම (දැවීමෙන් පසු ඉතිරිවන)

(vii) (අ) ශිෂ්‍ය නායිකාවක විසින් උදය රැස්වීම මෙහෙයවනු ලබයි / මෙහෙයවෙයි / මෙහෙයවනු ලැබේ / මෙහෙය වේ
(ආ) කම්කරුවන් විසින් පාලම ඉදි කරන ලදී / ඉදිකෙරිණි / ඉදිකරනු ලැබීය / ඉදිකරන ලද්දේ ය

(viii) (අ) විද්‍යාලයීය
(ආ) අතිඋත්කර්ෂවත්

(ix) (අ) හේන කෙටීම
(ආ) හිමිදිරිය

(x) (අ) අද්විතීය
(ආ) බහුපා (ලකුණු 2 x 10 = 20)

(02) ලකුණු විග්‍රහය
1. සාරවත් භාවය (මාතෘකාව ඇතුළුව) ලකුණු 08 යි.
2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12 යි.
3. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදීම ලකුණු 05 යි. මුළු ලකුණු 25 යි.
   * සාරවත් බව - 1
   * මාතෘකාව - 1
   * 2022 සාමාන්‍ය පෙළ විභාගයේ රචනාවට දුන් ලකුණු පටිපාටිය වැඩිදුරටත් අධ්‍යයනය කරන්න.

(03) පහත ප්‍රධාන කරුණු පිළිබඳ සලකා සාර්ථක පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.
ප්‍රධාන කරුණු
1. මහා සම්ප්‍රදාය, විශ්වීය, ගැඹුරු මෙන් ම දාර්ශනික වූ ද ලිඛිත එකකි.
2. චූල සම්ප්‍රදාය මුඛ පරම්පරාවෙන් පැවතේ.
3. එය ප්‍රාදේශීය මෙන් ම සරල සම්ප්‍රදායකි.

4. ඇතැම් සංස්කෘතිකාංග හැඳින්වීමට මෙම සම්ප්‍රදායන් දෙකම අවශ්‍ය වේ.
5. ජීවනෝපාය මාර්ගයන්ගෙන් උපදින ජන කවියෙන් ගැමි සංස්කෘතිය නිරූපණය වේ.
6. පැරණි ගැමි සමාජය කෘෂි ආර්ථිකයක් යටතේ කේන්ද්‍රගත ව ඇත.

ලකුණු ලබාදීම
1. ප්‍රධාන කරුණු සඳහා - ල. 06
2. ශිල්පීය දක්ෂතා - ල. 02
3. වචන ගණන - ල. 02

(තනි ඡේදයක් ලෙස ලියා තිබිය යුතුය.) (ල. 10)

(04) (i) සංක්‍රමණ යුගය
(ii) නවකතාව, කෙටිකතාව හා නාට්‍ය
(iii) පොත් බොහොමයක් විනාශ වීම. / ඉතිරි වූ පොත් ලබා ගැනීම අසීරු වීම.
(iv) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්
(v) අද්භූත සාහිත්‍යය, ක්‍රිස්තියානි සාහිත්‍යය (ල. 10)

(05) (අ) ලිපිය

| | | | |
|---|---|---|---|
| 1. | ආකෘතිය | - | ලකුණු 05 |
| 2. | මිනිසුන් කැලි කසළ ගෙනවිත් දමන බව | - | ලකුණු 03 |
| 3. | එයින් සිදුවන හානිය | - | ලකුණු 02 |
| 4. | කසළ නොදැමීමට ක්‍රියාත්මක වන ලෙස ඉල්ලීම | - | ලකුණු 02 |
| 5. | අක්ෂර වින්‍යාස, පද බෙදීම ආදී ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 |

**නැතහොත්**

| | | | | |
|---|---|---|---|---|
| (ආ) 1. | ආකෘතිය | - | ලකුණු 05 | |
| 2. | ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර ඇති බව | - | ලකුණු 03 | |
| 3. | දැනුවත් කරන්නේ කාටද යන බව | - | ලකුණු 03 | |
| 4. | නිර්මාණශීලී බව | - | ලකුණු 02 | |
| 5. | ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 | (ලකුණු 15) |

## III කොටස

| | | | |
|---|---|---|---|
| 01 (i) | (අ) ගිරාපෝතකයා / ගිරා පැටවා | (ආ) | කේවට්ට බමුණාට |
| (ii) | (අ) වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයා | (ආ) | උම්මග්ග ජාතක කතාව |
| (iii) | සතොසින් විඳ විඳ ලොබ නොසිඳේයා<br>මෙලෙසින් වෙණ නද අසන සඳේයා | | |
| (iv) | (අ) විලේජ් ඉන් ද ජංගල් | (ආ) | බැද්දේගම |
| (v) | (අ) අංගුලිමාල | (ආ) | අමාවතුර |
| (vi) | (අ) වත්ථුලපබ්බත | (ආ) | පද්මාවතී පිරිවෙන් විහාරය |
| (vii) | (අ) මෙමියුරු පදැති සැළලිහිණිය අස්න යෙදී | (ආ) | 108 |
| (viii) | (අ) ධම්මපදට්ඨ කතාව | (ආ) | බුද්ධඝෝෂ හිමි |
| (ix) | (අ) උග්ගසේන සිටු පුත්‍රයා පිළිබඳ ව | (ආ) | උග්ගසේනගේ යහළුවා / මිත්‍රයා |
| (x) | (අ) ඈ පද්‍ය ග්‍රන්ථය | (ආ) | එච්. එම්. කුඩලිගම මහතා |

(ලකුණු 2 x 10 = 20)

(02) (i) (අ) මහෞෂධ පඬිතුමාගේ චරපුරුෂයෙක්
චූලනී බ්‍රහ්මදත්ත රජතුමාට
(ආ) දස දහසක් යොදුන් දඹදිව රජුන් සේනාව පිරිවරා අවුත් නුවර පිරිවරා සිටි කල සැණකෙළි පැවැත්වීම.

(ii) (අ) පියුම්රා - පද්මරාග හෙවත් රතු කැට
තඹුරු - නෙළුම්
(ආ) ඕලු, මානෙල්, එළ මානෙල්, නෙළුම් යන මල්වලින් පිරුණු හිම හා සමාන සීතල ජලයෙන් යුක්ත වූ ගැඹුරු ජලාශය

(iii) (අ) කොසොල් රජතුමා / අගුල්මල් තෙරුන් වහන්සේ
(ආ) භර්ග, මන්තාණි / භර්ග බ්‍රාහ්මණයා, මන්තාණි බැමිණි

(iv) (අ) නොවළහා - නොසඟවා, හංගන්නේ නැති ව
වල්කලා - ගස්වැල්වල පොතුවල කෙඳිවලින් වියූ රෙදි
(ආ) පින් පිඩ වැනි මා මැණිය

(v) (අ) සුමුවෝයා - සමූහව / එක්රැස් වී / රජවූ ගැසී
සමුවෝයා - හමුව / සම්මුඛව
(ආ) සිත්කලු වනපෙතින් රංවූ පිරිත් මුවෝ පැමිණ සිතුවිලි නැති රූප විලස මිනිසුන් හමු වුවද බිය නොවී සිටීම. (ලකුණු 4 x 5 = 20)

(03) (i) අර්ථ රසය සඳහා උපමා, රූපක යෙදී ඇති නිදසුන්
* වර වෙණ නද අසමින් සිත සතොසිනි යන කවියේ ''සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි'' පද්‍ය පාඨ උපුටා දැක්වීම.
* රෑ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා යන කවිය
* පුන් මදාරා මල් දමින් මුදු
දිගු සුනිල් වරලස ගොතා ..... යන කවිය

(ii) ශබ්ද රසය සඳහා අනුප්‍රාසය, එළිසමය, විරිත් යෙදී ඇති නිදසුන්
* දිය දිය ගොස පළ කෙරෙමින් ඒ සපැමිණි .... යන කවිය
* ළඟ ළඟ වා උනුනට කර වාදය.... යන කවිය
* දිමුතු යසස් වන් කුසුම සරාගේ .... යන කවිය
* රෑ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දි දී විදුලිය පබා .... යන කවිය

වැනි නිදසුන් හෝ අදාළ වෙනත් නිදසුන් යොදා විස්තර කිරීම.

**නැතහොත්**

(i) සුවච කීකරු ගති ලක්ෂණ සහිත වීම.
* හෙ ධර්මාන්තෙවාසිකව ශිල්ප උගන්නි. වත්සපනැ කී කී දැයක් වහා සපයයි. මන වඩන නියායෙන් හැසිරෙයි. පෙම් වඩන නියායෙන් බෙණෙයි.''
* තම ගුරුවරයා ''ශිල්පයට උපචාර නොකරන්නා එල නො දෙයි පුතැ යි කී විට අහිංසක ක්‍රියා කළ ආකාරය''
* හෙ පඤ්චායුධ ගෙනැ ආචාර්යයා වැඳැ අටවියට වැදැ අටවියට වදනාතන්හිදු අටවිය මධ්‍යයෙහිදු අටවියෙන් නික්මෙන තන්හිදු සිටැ මිනිසුන් මරයි. පිළි ඈ කිසි අයතියක් නොගන්නි.''

(ii) බාහිර හේතු නිසා දාමරික ගත ලක්ෂණ සහිත වීම.
* ''රෑ ගමට වැදැ පයින් පැහැරැ දොර ගලවා පියා එහි හොතුවන් මරා පියා එකෙකැ දෙකෙකැ'යි ගැණැගෙන යෙයි.''
* ''අටවියට වැදැ අටවියට වදනා තන්හිදු අටවිය මධ්‍යයෙහිදු අටවියෙන් නික්මෙන තන්හිදු සිටැ මිනිසුන් මරයි.''
* අගුල්මල් නම් සොරැ, දරුණැ, ලෙහෙමුඩු අත් ඇත්තෙ යැ. සතුන් කෙරෙහි කුළුණු නැත්තෙයැ ගම් නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ දනවු නොදනවු කෙළෙ මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොට දරයි.''

(ලකුණු නිදසුන් සඳහා 4 යි. පැහැදිලි කිරීමට ලකුණු 11 යි. මුළු ලකුණු 15 යි.)

(04) (i) කුරක්කන් ගොවියා අභියෝග ජය ගැනීමට දැරූ වෙහෙස

* එල්ල වෙන්නට කවි කර කීවෙමි බොහොම.... යන කවිය
  මෙහි දී කවියා දැඩි වෙහෙසක් දරා අභියෝගයක් ජයගෙන ඇත. වැපුරූ බීජ ආරක්ෂා කර ගැනීම නිසා ''නිල්ල අඹති සත් දවසින් බැලුවාම'' යන පද්‍ය පාඨයෙන් නිරූපණය වේ. අභියෝගයක් ජය ගත් අවස්ථාවකි.
* ''මා කි දේ දෙයියනි බොරුවක්ම නැති ......'' යන කවිය.
  මෙමගින් ද වෙහෙස දරා අභියෝගයක් ජය ගෙන ඇත. ඒ බව 4 වන පද්‍ය පාඨයෙන් අර්ථවත් වේ.
  (මේ සඳහා වෙනත් අදාළ නිදසුන් ද යොදාගන්න.)

(ii) දැරූ වෙහෙස අව්‍යාජව ඉදිරිපත් කිරීම.

* ''දුරුතු මහේදී කැලයට වැදීලා.....'' යන කවිය .
* හේනේ පැලේ මා විදිනා සුරුක්කන්'' යන කවිය.
* මා කී දේ දෙයියනි බොරුවක් ම නැති.....' යන කවිය.
* ''කටු ඇල්ලේ මගෙ හේනේ කුරක්කන්....' යන කවිය.

නැතහොත්

(i) මහෞෂධ චරිතය උසස් ලෙස නිරූපණය කිරීම.

* ''මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත් වැ හින් ද දීම මෙතෙක් රජ දරුවන් මිය යාම යුක්ත නොවන්නේ ය.''
* ''මහෞෂධ පණ්ඩිතයන් විසින් රක්නා ලද මිථිලා නම් රාජධානිය සිංහයෙකු විසින් රක්නා ලද රන් ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසි කෙනෙකුන් විසින් ගන්නට නොහැක්කී ය.''
* ''සිංහයෙකු මෙන් කිසි බයක් නැති වැ නුවර මුළුල්ලෙහි රකවල් සකස් කොට ලවා''
* ''එක් සියයක් රජ දරුවෝ ඒ මහතාණන් වහන්සේ රූපෛශ්වර්යය දැක නුවණින් සියලු දඹදිව දෙවන කෙනෙකුන් නැති......''

(ii) කෙවට්ට චරිතය හාස්‍ය උපහාසය දැනවෙන චරිතයක් ලෙස නිරූපණය කිරීම.

* ''සාල්ලෙකලාල පාතට බානා කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඩක් හෙළා''
* ''නැගී සිටුව ! ආචාරිනි, නැගී සිටුව ! ආචාරිනි, මම බාලයෙමි තොපගේ මුණුබුරු තරමට ඇත්තෙමි...''
* කොල පව්වු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලස්සන වූ අඥාන බමුණු මහල්ල තෝ ධර්ම යුද්ධය කෙරෙමියි කීයා.....''

05, 06, 07 ප්‍රශ්න සඳහා අදාළ නිදසුන් සපයමින් ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.
(ලකුණු - නිදසුන් සඳහා ලකුණු 03 යි. පැහැදිලි කිරීම සඳහා ලකුණු 07 යි. මුළු ලකුණු 10 යි.)